**ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම, පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ මහාමාර්ග අංශයට හා උසස් අධ්‍යාපන අංශයට අදාළ කළමනාකරණ විගණන වාර්තා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ වන මහාමාර්ග අංශය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 1 වන කොටසේ 2.1 ඡේදයේ සිට 2.17 ඡේදය දක්වා වූ ඡේදවලද, උසස් අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ 2 වන කොටසේ 3.1 ඡේදයේ සිට 3.10 ඡේදය දක්වා වූ ඡේදවලද සඳහන් කර ඇත. මූල්‍ය පාලනයේ ප්‍රමාණවත් බව

තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ------------------------------------------------- | | ------------------------------- | ----------------- |
| **මුදල් රෙගුලාසි** | | | |
| **----------** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.1.1 හා 3.1.2 |
| | | 2. සැලැස්මට අනුකූල නොවන පරිදි අරමුදල් නිදහස් කිරීම | 2.1.2(ඉ) . |
| | | 3. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.17 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම. | 1. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.14.1 |
| | | 2. කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අය කිරීමේ අඩුපාඩු | 2.14.2 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.18 |
| | | 4. අවිධිමත් ගනුදෙනු | 3.5 |
| | | 5. කළමනාකරණ අඩුපාඩු | 3.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.1.2 (අ) |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 (ආ) හා 3.1.3 |
| | | 3. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.2 (ඇ) |
| | | 4. පසුගිය වර්ෂවල කළ වැඩ සඳහා බිල්පත් ගෙවීම | 2.1.2 (ඈ) |
| | | 5. ව්‍යාපෘති පිරිවැය නොසැසඳීම | 2.2.1(අ) |
| | | 6. ව්‍යාපෘතිවල කාර්යසාධනය පිළිබඳ අඩුපාඩු | 2.2.1(ආ) |
| | | 7. ව්‍යාපෘතිවල සමහර කර්මාන්ත අත්හැර දැමීම | 2.2.1 (ඇ) |
| | | 8. ව්‍යාපෘතිය විසින් කර තිබුණු සමහර වියදම් මතභේදාත්මකවීම | 2.2.1 (ඈ) |
| | | 9. සංස්ථාපිත බැඳුම්කර ලබා නොගැනීම | 2.2.1(ඊ) |

| | | | |
|---|---|---|---|
| | | 10. වැඩ නිමකළ කොන්ත්‍රාත් සඳහා විචලතා නියෝග පදනම් කරගෙන ඉදිකිරීම් කිරීම | 2.2.1 (උ) |
| | | 11. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් නිසා අතිරේකව ගෙවා තිබුණු පොලිය | 2.2.1 (ඌ) |
| | | 12. කොන්ත්‍රාත්කරුට වාසිවන පරිදි ගිවිසුම්වලට එළඹීම | 2.2.1 (එ) |
| | | 13. පූර්ව කොන්ත්‍රාත් අදියරේදී සිදුව තිබූ අඩුපාඩු | 2.2.1 (ඒ) |
| | | 14. ව්‍යාපෘති සැලැසුම්කරණ දුර්වලතා | 2.2.1 (ඔ) |
| | | 15. ප්‍රමාණ පත්‍රවල ඇතුළත් රේටයන් තාත්ත්වික නොවීම | 2.2.1 (ඕ) |
| | | 16. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කිරීම | 2.2.1 (ක) |
| | | 17. අනාර්ථික ගනුදෙනු | 2.2.1(ග), 2.8 හා 3.6 |
| | | 18. දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල අඩුපාඩු | 2.2.2 |
| | | 19. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.10(ඇ) |
| | | 20. නේවාසිකාගාර ඉදිකිරීමේ අඩුපාඩු | 3.1.1 |
| | | 21. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනයේ අඩුපාඩු | 3.2.1 |
| | | 22. වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 3.3.(අ) |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වනු පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම | 2.4 හා 3.3(ආ) |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.9 |
| | | 3. වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීම | 2.1.3 හා 3.1.4 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු | 1. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.12 |

| | | | |
|---|---|---|---|
| | ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | | |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේදී දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීම | 2.5 (අ) හා 3.4 |
| | | 2. අයවැය ප්‍රතිපාදන රහිතව බැරකම් එළඹෙන වර්ෂයට ගෙනයාම | 2.5(ආ) |
| | | 3. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.10 (අ) හා 3.8(අ) |
| | | 4. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.10(ආ) හා 3.8(ආ) |
| | | 5. පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.10(ඇ) හා 3.8(ඇ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ අඩුපාඩු | 2.11 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන | 1. පාඩු හා හානි | 2.6 හා 3.9 |
| | | 2. හානි පිළිබඳ වගකීම | 2.7 |

දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

**1 වන කොටස - මහාමාර්ග අංශය**

-----------------------------------

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------**

**2.1 කාර්යසාධනය**

**----------------**

**2.1.1 සැලැසුම් කිරීම**

**----------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී මහාමාර්ග අංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 08 ක් යටතේ කාර්යයන් 61 ක් පැවැතුණි. මහාමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක කර තිබූ විදේශ ආධාර ව්‍යාපෘති 37 ක්, දේශීය අරමුදලින් මූල්‍යනය කෙරෙන එක් වැඩසටහනක් හා තවත් එක් අරමුදලක් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරී සැලැස්ම අනුව මූලධන වියදම් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.මිලියන 116,017 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේම අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම නිසා මුළු ප්‍රතිපාදනය රු. මිලියන 205,922 ක් වී තිබුණි. එසේ අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම නිසා ඉටුකළ යුතු කාර්යභාරයන්වල වෙනස්වීමට අනුකූල වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

**-------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මහාමාර්ග අංශය විසින් ක්‍රියාත්මක කළ යුතු විදේශාධාර ව්‍යාපෘති 37 කින් ව්‍යාපෘති 08 ක් සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම ප්‍රමාදවීම, වන්දි ලබාදීමේ ක්‍රමවේදය ගැසට් පත්‍රයේ පළ නොකිරීම, අත්පත් කරගන්නා ලද ඉඩම් සඳහා තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය, මහා භාණ්ඩාගාරය අක්මුදල් නිදහස් කිරීමට කටයුතු නොකිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වියදම සනාථ කිරීමට අවශ්‍ය ලේඛන භාණ්ඩාගාරයට ඉදිරිපත් නොකිරීම යනාදි විවිධ හේතු මත ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. එසේ ඉටුනොකළ කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 732.93 ක් අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණු මහනුවර උමඟ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී සලසා ගෙන තිබුණු අතිරේක ප්‍රතිපාදනවලින් කිසිඳු උපයෝජනයක් නොකිරීම නිසා

මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. නමුත්, දිළිඳු හිතකාමී නැගෙනහිර පළාත් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 525 ක බැරකම්වලට එළඹ තිබුණි. එම බැරකම් 2018 වර්ෂයේදී පියවීම සඳහා 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2018 වර්ෂයේදී එම බැරකම් පියවීම සඳහා පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ප්‍රතිපාදන ලබාගැනීමට සිදු වී තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කාර්යයන් 61 ක් ඉටුකිරීම සඳහා විවිධ ව්‍යාපෘති 39 ක් සඳහා රු.මිලියන 191,761 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, ඉන් කාර්යයන් 24 ක අපේක්ෂිත නිමැවුම් මට්ටම ලගා කරගෙන නොතිබුණි.

**(ඇ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

බෙස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ අදියර III ව්‍යාපෘතිය රු.මිලියන 719 ක ඇස්තමේන්තුගත වියදමක් මත 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 541.76 ක් වැය කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් නොකිරීම නිසා එම ව්‍යාපෘතිය අතහැර තිබුණි.

**(ඈ) පසුගිය වර්ෂවල කළ වැඩ සඳහා බිල්පත් ගෙවීම**

2015 හා 2016 වර්ෂවලදී සිදු කළ කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරය විසින් අක්මුදල් ලබා නොදීම නිසා සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,629.99 ක් ඉකුත් වර්ෂවල බිල්පත් ගෙවීම සඳහා වැය කර තිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මහාමාර්ග අංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, දින 56 ක ප්‍රමාදයකින් පසුව 2018 ජූලි 26 දින එය පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී මහාමාර්ග අංශය විසින් දේශීය අරමුදල් යොදවා කරන එක් අරමුදලක්, මහ නැගුම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 1,358 ක්, මාර්ග පුළුල් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 25 ක් හා විදේශාධාර ව්‍යාපෘති 37 ක් සඳහා රු.මිලියන 199,812 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 185,652 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 14,160 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.08 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 2.2.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ව්‍යාපෘති පිරිවැය නොසැසඳීම**

මහාමාර්ග අංශය හරහා අරමුදල් සැපයූ විදේශාධාර ව්‍යාපෘති 07 ක විසර්ජන ගිණුමේ වූ විදේශාධාර පිළිබඳ වියදම එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශනවල විදේශාධාර උපයෝජනය සමඟ සැසඳීමේදී ව්‍යාපෘති 04 ක හා ව්‍යාපෘති 03 ක වියදම විසර්ජන ගිණුමේ වියදමට වඩා පිළිවෙලින් රු.මිලියන 3,537 කින් වැඩියෙන් හා රු.මිලියන 594.9 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) **ව්‍යාපෘතිවල කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දකුණු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරමින් පවත්නා කැස්බෑව සිට පොකුණුවිට සහ කිරුළපන සිට ගොඩගම දක්වා වන මාර්ග සඳහා කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය සහ අඩු ප්‍රගතිය පිළිබඳ සැලකිල්ලට නොගෙන රු.මිලියන 49 ක තාවකාලික මුදල් අත්තිකාරම් ලබා දී තිබුණි.

(ii) ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල අඩු ප්‍රගතිය සහ සැලැසුම් කිරීමේ දුර්වලතාවයන් නිසා එ.ජ.ඩො. මිලියන 6.13 කට සමාන රු.මිලියන 923 ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති කටයුතුවල පෙන්නුම් කළ දුර්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිඵලයක් ලෙස ණය මුදල් මුදාහැරීමේ සැලැසුමට අනුව කටයුතු නොකිරීම නිසා ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො.305,203 කට සමාන රු.මිලියන 46 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) **ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

දකුණු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මොරටුව සිට පිළියන්දල සහ රත්මලාන සිට මිරිහාන දක්වා වන මාර්ග වෙනුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව මගින් රු. මිලියන 1,322 ක වැඩ ඇස්තමේන්තු කර තිබුණද, කළ යුතු වැඩ වෙනුවෙන් රු.මිලියන 654 දක්වා මුදලක් කපාහැර තිබුණි. එසේ වුවද, මුල් ඇස්තමේන්තුව පදනම්ව වැඩිපුර ගෙවා තිබුණු රු.මිලියන 104 ක සංචලන අත්තිකාරම් මුදල අයකර ගැනීමට මහාමාර්ග අංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) **ව්‍යාපෘති විසින් කර තිබුණු වියදම් මතභේදාත්මක වීම**

ලංසු ලේඛන පිළියෙල කිරීමේදී සහ ලංසු ඇගයීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිය වගකීම නිසි ලෙස ඉටු නොකිරීම හේතුවෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහනට සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති ගිවිසුම්වල සාමාන්‍ය කොන්දේසිය යටතේ කාර්යසාධන බැඳුම්කරවල පිරිවැය කොන්ත්‍රාත්කරු විසින්ම දරාගත යුතුව තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 630 ක බැඳුම්කර පිරිවැය ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ii) කාර්යසාධන බැඳුම්කර පිරිවැයෙහි රේටය එකතු අගය (lump sum) ලෙස ඇතුළත් කිරීම නිසා එහි සඳහන් මුළු මුදලම සත්‍ය පිරිවැය නොසලකා ගෙවීමට එකඟවී තිබුණි. එම නිසා ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන විසින් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 340 ක් වැඩි පුර ගෙවා තිබුණි.

**(ඉ) අරමුදල් නිදහස් කිරීම සැලැස්මට අනුකූල නොවීම**

---

ව්‍යාපෘති කටයුතුවල පෙන්නුම් කළ දුර්වල භෞතික හා මූල්‍ය කාර්යසාධනයේ ප්‍රතිඵලය ලෙස ණය මුදල් මුදාහැරීමේ සැලැස්මට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වූ ප්‍රමාදය නිසා රු.මිලියන 46 ක ප්‍රමාද ගාස්තු ණය ප්‍රදානය කළ ආයතන වෙත ගෙවා තිබුණි.

**(ඊ) සංස්ථාපිත බැඳුම්කර ලබා නොගැනීම**

---

ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ යලි අපනයන පදනම යටතේ බදු නිදහස් පදනමට රු.මිලියන 323 ක භාණ්ඩ ආනයනය කර තිබුණි. නමුත් ඊට අදාළ වැඩ භාර ඉංජිනේරුවරයාගේ අනුමැතිය හෝ ඒ සඳහා අවශ්‍ය සංස්ථාපිත බැඳුම්කර ලබාගෙන නොතිබුණි. තවද, මෙකී භාණ්ඩ ව්‍යාපෘතිය අවසානයේ දී ප්‍රති අපනයනය කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් අධීක්ෂණයක් සිදුකරන බව විගණනයට තහවුරු වී නොතිබුණි.

**(උ) වැඩ නිමකළ කොන්ත්‍රාත්වල විචලතා නියෝග පදනම් කරගෙන ඉදිකිරීම් කිරීම**

---

දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව සිට ගොඩගම දක්වා කොටසේ ඉදිකිරීම් 2014 මාර්තු මාසයේදී අවසන් කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 13.1 කොන්දේසියට පටහැනි ලෙස නිකුත් කළ විචලන නියෝග 198 ක් හේතුවෙන් 2017 වර්ෂයේ අවසානය වන විටත් ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. විචලන නියෝග මත ගෙවා තිබුණු මුදල, කළ වැඩ වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස සියයට 106 ක් වී තිබුණි.

**(ඌ) ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදය නිසා ප්‍රමාද පොලී ගෙවීම**

---

බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ ඉඩම් කැබලි 5411 ක් අත්පත් කර ගැනීමට සැලැසුම් කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් කැබලි 40 ක් සඳහා පමණක් රු.මිලියන 13.3 ක් ගෙවා තිබුණි. නිසි වේලාවට ඉඩම් අත්පත් කර නොගැනීම නිසා ඉඩම් කැබලි 38 ක් සඳහා රු.මිලියන 3.8 ක ප්‍රමාද පොලියක් ගෙවා තිබුණි.

**(එ) කොන්ත්‍රාත්කරුට වාසිවන අයුරින් ගිවිසුම්වලට එළඹීම**

---

බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ ඉදිකිරීම්වලට අදාළ ප්‍රමාණ පත්‍රයේ ඇතුළත් පරීක්ෂණාගාර උපකරණ සඳහා එකතු අගය(lump sum) රේටයන් යටතේ රු.මිලියන 27 ක් ගෙවා තිබුණි. උපකරණවල අයිතිය ව්‍යාපෘතිය අවසන් වීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරු වෙත පැවරෙන ආකාරයට ගිවිසුම්වලට එළඹ තිබුණි.

**(ඒ) පූර්ව කොන්ත්‍රාත් අදියරේදී සිදුව තිබූ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** නව කැලණි පාලම සිට අතුරුගිරිය දක්වා එලිවේටඩ් (Elivated) මහාමාර්ග ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් වාර්තාව සැකසීම හා නැවත පදිංචි කිරීමේ සැලැසුම් සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිවෙලින් රු.3,945,000 ක් සහ රු.3,713,760 ක වටිනාකම්වලට මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. 2018 මාර්තු 31 දින වන විටත් එම වාර්තා හා සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

(ii) ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය එ.ජ.ඩො මිලියන 1,271 ක සෘණ අගයක් මඟින් දක්වා තිබුණත්, එම ව්‍යාපෘතිය වලංගු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි.

**(ඔ) ව්‍යාපෘති සැලැසුම්කරණ දුර්වලතා**

**-----------------------------------**

බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ මිනින්දෝරු සැලැස්ම පිළියෙල කිරීමට රු.605,000 ක් වැයකර තිබුණි. එම සැලැස්මේ වූ ගෙවා පිළියෙල කර දී තිබූ වැරදි මිනින්දොරු මිනුම් හේතුවෙන් සැලැසුම් කටයුතු පමා වී තිබුණි. ඒ හේතුව මත කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමක් ව්‍යාපෘතියේ ආරම්භක අවධියේම ඉල්ලා තිබුණි. එම කාලදිගුව ලබාදීම සඳහා පදනම් වන හේතු හා ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි.

**(ඕ) ප්‍රමාණ පත්‍රවල ඇතුළත් රේටයන් තාත්ත්වික නොවීම**

**------------------------------------------------------**

බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ ප්‍රමාණ පත්‍රවල ඇතුළත් රක්ෂණ අයිතමය සඳහා lump sum රේටය යටතේ රු. මිලියන 26 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් රක්ෂණ වියදම් ලෙස රු.මිලියන 21 ක් වැයකර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ගෙවා තිබුණු මුදලට වැඩියෙන් රු.මිලියන 5 ක් ව්‍යාපෘතිය විසින් පියවා තිබුණි. ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී ඒ කෙරෙහි අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ක) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කිරීම**

**-------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අංක 03 කොටසට අදාළව උපදේශක සමාගමක් සහ කොන්ත්‍රාත් සමාගමක් තෝරාගැනීමේ පටිපාටිය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1 මාර්ගෝපදේශයෙහි සඳහන් අරමුණුවලට පටහැනිව ක්‍රියාත්මක කර තිබුණි. එසේ කොන්ත්‍රාත්කරු තෝරාගෙන වර්ෂයකට වඩා අධික කාලයක් ගතවී තිබුණත්, 2018 නොවැම්බර් මාසය වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව බදුල්ල චෙන්කලාඩි මාර්ග ව්‍යාපෘතියේ ප්‍රමාණ පත්‍රවල ඇතුළත් අවිනිශ්චිතයන් සඳහා වෙන්කිරීම් සහ නිශ්චිත වෙන්කිරීම්වල අගයන් සැලකිල්ලට ගැනීමෙන් තොරව සංචලන අත්තිකාරම් ලෙස රු.මිලියන 456 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ ගෙවන ලද රු. මිලියන 5,928 ක මුළු සංචලන අත්තිකාරම් වටිනාකම ඉදිකිරීම් නතර වීම හේතුවෙන් 2018 සැප්තැම්බර් 14 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ග) අනාර්ථික ගනුදෙනු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 03 කොටසට අදාළව 2014 දෙසැම්බර් 31 දින වන විට උපදේශක ආයතනයට ශක්‍යතා අධ්‍යයන වාර්තා පිළියෙල කිරීමට රු.මිලියන 1,335 ක් ගෙවා තිබුණි. එසේ වුවද, එම ආයතනයේ වාර්තා පිළිගත හැකි

තත්ත්වයක නොපවතින නිසා මේ සම්බන්ධව විවිධ අධ්‍යයන සඳහා බාහිර ආයතනවලට රු.මිලියන 97 ක් ද ගෙවා තිබුණි. 2018 අගෝස්තු 31 දින වන විටත් අවසාන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**(ii)** ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ පාමංකඩ සිට කැස්බෑව දක්වා ගස් රෝපනය කිරීම සඳහා එක් පැලයකට රු. 4,000 ක සිට රු. 9,677 ක් දක්වා ඉහළ පරාසයක මිල ගණන් මත ගෙවීම් කර තිබුණි.

**(iii)** ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහනේ ප්‍රමාණ පත්වල සඳහන් පරිදි එකතු වටිනාකම (lump sum) රේටය යටතේ මිලදී ගෙන තිබූ රු.මිලියන 466 ක ස්ථාවර වත්කම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සත්‍යාපනය කර නොතිබුණි. තවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වත්කම්වල අගයෙහි සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය සහ ඇගයීම පිළිබඳව තහවුරු කර ගැනීමට නොහැකි විය. අන්තර් ගෙවීම් සහතිකවල අනුමැතිය සහ සහතික කිරීම සිදු කළ පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

---------------------------------

මහනැගුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෑගල්ල, මහනුවර, කුණ්ඩසාලේ සහ කළුතර විධායක ඉංජිනේරු කාර්යාලවලට අදාළව ඉදිකරන ලද මාර්ග පිළිබඳ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කෑගල්ල, මහනුවර හා කුණ්ඩසාලේ විධායක ඉංජිනේරු කාර්යාල**

---------------------------------------------------------------

2016 පෙබරවාරි 25 දිනැති අංක MHE&H/HYW/MN/Cir - 01/2016 දරන උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ,

(i) චක්‍රලේඛයේ ඇමුණුම A - 1 හි 1.6.6 ඡේදයට ප්‍රකාර මාර්ගයේ දෙපස උරහිස් (shoulders) අන්තරාදායක නොවන පරිදි බොරළු පස් පුරවා තලා සකස් කළ යුතු බව ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර, ගිවිසුම්වලට එළඹ තිබුණි. නමුත්, කෑගල්ල විධායක ඉංජිනේරු කාර්යාලය යටතේ නිමකර තිබුණු මාර්ග 5 ක් ඒ අනුව සකස් කර නොතිබුණි.

(ii) චක්‍රලේඛයේ ඇමුණුම A- 3 හි 02 ඡේදය අනුව Core සාම්පල සම්පීඩන ශක්තිය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වුවහොත් යොදාගැනීම පිණිස Core සාම්පල් විනාශ නොකර තබාගත යුතුව තිබුණි. නමුත්, Core සාම්පල් පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන පරිදි ගබඩා කර නොතිබුණි. කොන්ක්‍රීට් Core සාම්පල් ලබාගැනීම සහ ඒවා පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උපකරණ විධායක ඉංජිනේරු කාර්යාලවලට ලබාදී නොතිබුණි.

(iii) චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව තත්ත්ව පරීක්ෂණ වාර්තා සහතදායි සහ වඩා විශ්වාසවන්තව ලබා ගත හැකි ආයතන 05 ක් සඳහන් කර තිබුණි. ඉන් බැහැරව කෑගල්ල විධායක ඉංජිනේරු කාර්යාලය විසින් සංවර්ධනය කරන ලද මාර්ගයන්ට අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තා චක්‍ර ලේඛයේ සඳහන් කර තිබුණු ආයතනවලින් බැහැරව එක් පෞද්ගලික ආයතනයකින් ලබා ගෙන ඒ සඳහා රු.146,383 ක් ගෙවා තිබුණි.

(iv) චක්‍රලේඛයෙහි ඇමුණුම A - 1 හි 2.3 ඡේදය ප්‍රකාරව කොන්ක්‍රීට් අතුරන ලද මාර්ගවල කොන්ක්‍රීට් අතුරනය 150 mm (අඟල් 6) ඝනකමින් යුක්තව පැවතිය යුතුව තිබුණි. කඩුගන්නාව විධායක ඉංජිනේරු කාර්යාලයේ ඉඩම්පිටිය සිට මල්ගම්මන

දක්වා මාර්ගයෙන් ලබාගත් core සාම්පලවල ඝනත්වය තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව 150 mm ක් ලෙස දක්වා තිබුණි. නමුත්, ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබාගත් සත්‍ය මිනුම්වලට අනුව එම ඝනත්වයෙන් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, එම ඝනත්වය නොමැතිව ඉදිකර තිබුණු මාර්ගයන්වලට වූ එකතුව රු.197,874 වැඩිපුර ගෙවා තිබුණි.

(v) චක්‍රලේඛයේ 2.2 ඡේදයට අනුව මාර්ගවල 150 mm (අඟල් 6) ක ඝනකමින් යුක්තව 1:2:4 අනුපාතයෙන් යුත් කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් ඇතිරිය යුතුව තිබුණි. ඒ අනුව කටයුතු කළ බව තහවුරු කර ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකින් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන තිබුණි. එම වාර්තාවල නිවැරදිතාවය තහවුරු වී නොතිබුණත්, එම වාර්තා පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.268,637 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(vi) චක්‍රලේඛය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලොග් සටහන් පොතක් පවත්වාගෙන යුතුව තිබුණි. නමුත් කෑගල්ල විධායක ඉංජිනේරු කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කළ බව තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ලොග් සටහන් පොතක් පවත්වා නොතිබුණි.

**(ආ) කළුතර විධායක ඉංජිනේරු කාර්යාලය**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අළුබෝමුල්ල මහගෙදරවත්ත මාර්ගය නිම කිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින රු.405,049 ක් ගෙවා තිබුණි. මාර්ගයට අදාළ පරීක්ෂණ වාර්තා අනුව ගැටි බැම්වලට කොන්ක්‍රීට් යෙදීම 2017 ජනවාරි 24 දින සිදුකර තිබුණු අතර, 2017 ජනවාරි 31 දින කොන්ක්‍රීට් පරීක්ෂාව සිදුකර තිබුණි. ඒ අනුව, මාර්ගයේ වැඩ නිම කිරීමට ප්‍රථම ගෙවීම් කර තිබුණි.

(ii) 2016 පෙබරවාරි 25 දිනැති අංක MHE&H/HYW/MN/Cir - 01/2016 දරන උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයෙහි ඇමුණුම A - 1 හි 1.5.7 ඡේදයට අනුව අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා මාර්ග සංවර්ධනය කිරීමේදී මාර්ගයේ දෙපස ගැටි බැමි උස 300 mm (අඟල් 12) කින් යුක්ත විය යුතුව තිබුණි. නමුත් මාර්ග 22 ක පැති බැම්මෙහි සත්‍ය උස 100 mm ක සිට 280 mm ක් දක්වා පරාසයක පැවතුණි.

(iii) මාර්ග 14 ක දෙපස ගැටි බැමි සහ මාර්ග දෙකෙලවර කොන්ක්‍රීට් සඳහා ගෙවීම් කිරීමට අදාළ මිනුම් වාර්තා හා භෞතික පරීක්ෂාවේදී ලබාගත් මිනුම් වාර්තා සැසඳීමේදී එකතුව කොන්ක්‍රීට් 27 $m^3$ ප්‍රමාණයක් සඳහා රු.310,404 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) සංවර්ධනය කරන ලද මාර්ගයේ ගැටි බැම්මේ ආරම්භයේ සහ අවසානයේ ව්‍යාපෘති දිනය හා අංකය යෙදීම අනිවාර්යයෙන් සිදුකළ යුතුව තිබුණි. මාර්ග 16 ක එලෙස අංකය හා දිනය සඳහන් කර නොතිබුණි. මේ හේතුව නිසා තාක්ෂණික නිලධාරීන් සමඟ කරන ලද භෞතික පරීක්ෂණයේදී පෙන්වා දෙන ලද මාර්ග, මෙම ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද මාර්ගයන්ද යන්න තහවුරු කරගැනීමට අපහසු කාර්යයක් වී තිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් සේවා ලබා ගැනීම**

මහාමාර්ග අංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් දේශීය සැපයීම් හා සේවා ලබා ගැනීම සඳහා රු. මිලියන 53 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 51 ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

**2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන සංඛ්‍යාව 124 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.මිලියන 118,232.27 ක් වී තිබුණි. නමුත්, ක්‍රියාවලියේ පැවති ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 431 ක් වටිනා කොන්ත්‍රාත්තු පමණක් ප්‍රදානය කර තිබුණි. එහි ප්‍රගතිය සියයට 0.36 ක් පමණ අඩු මට්ටමක පැවැතුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තා සති 7 ක ප්‍රමාදයකින් පසුව 2018 මැයි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව, භෞතික තොග ශේෂය හා පොත්වල ශේෂය අතර වෙනස්කම් සම්බන්ධව මුදල රෙගුලාසි 757(2) හා (2ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් හෙලිදරව් වූ භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 සඳහා සලසා තිබුණු රු.මිලියන 61,454 ක ප්‍රතිපාදනය රු.මිලියන 15,849 කින් ඉක්මවා රු.මිලියන 77,303 ක බැදීම් ඇති කරගෙන තිබුණි.

**(ආ) අයවැය ප්‍රතිපාදන රහිතව එළඹෙන වර්ෂයේදී ගෙවීම සඳහා බැරකම්වලට එළඹීම**

2013 ඔක්තෝබර් 27 දින කොළඹ- කටුනායක අධිවේගී මාර්ගය මහජනාතව සඳහා විවෘත කර තිබුණි. එම මාර්ගය ඉදිකිරීමට අදාළව 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 48.47 ක බැරකම්වලට එළඹ තිබුණි. 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ව්‍යාපෘතිය වෙනුවෙන්වූ බැරකම් පියවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණත්, 2017 අප්‍රේල් 27 දිනැති

අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ප්‍රතිපාදන රහිතව එම බැරකම්වලට එළඹ තිබුණි.

## 2.6 පාඩු හා හානි

මුදල් රෙගුලාසි 102(1), (ඇ) සහ 102(2) (ඇ) ප්‍රකාර වාර්තා වී තිබුණු රු.මිලියන 6.35 ක අලාභහානි මහාමාර්ග අංශයේ සිදු වී තිබුණත්, එම අලාභ හානි මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

## 2.7 හානි පිළිබඳ වගකීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1986 වර්ෂයේදී මාර්ග නඩත්තු කටයුතුවල තොග පිළිබඳව වාර්තා වී තිබුණු රු.168,000 ක පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වන විට වාහන අනතුරු 13 ක් වාර්තා වී තිබුණි. ඉන් 2016 හා 2017 වර්ෂවලදී නිල රථ දෙකකට සිදු වී තිබුණු අනතුරුවලින් තක්සේරු කළ අලාභය පිළිවෙලින් රු.මිලියන 4.07 ක් හා රු.මිලියන 1.16 ක් වී තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් 2018 ජුනි මාසය වන විටත් රක්ෂණ වන්දි ලබාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අනතුරට ලක් වූ වාහන පිළිබඳව මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අනතුර සිදු වී මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, වාහන 08 කට හැර ඉතිරි වාහන සම්බන්ධයෙන් වූ පූර්ණ වාර්තා සති 02 ක සිට මාස 08 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි. එහෙත් වාහන 08 සම්බන්ධයෙන් අනතුරු පිළිබඳ පූර්ණ වාර්තා 2018 ජුනි මාසය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2.8 අනාර්ථික ගනුදෙනු

2014 වර්ෂයේදී රු.මිලියන 34.69 ක් වැයකර මගනැගුම ව්‍යාපෘතිය යටතේ වූ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන්වල කටයුතු කාර්යක්ෂමව, ඵලදායීව ඉටුකර ගැනීම අරමුණු කරගෙන භූ විද්‍යාත්මක තොරතුරු පද්ධතියක් (GIS) හඳුන්වාදී තිබුණි. එසේ වුවද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) Policy & Procedures for ICT usage in Government ප්‍රකාරව රු.මිලියන 2 ට වැඩි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ICTA ආයතනය වෙතින් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාගත යුතුව තිබුණි. එම උපදෙස් ලබා ගැනීමෙන් තොරව එම පද්ධතිය ක්‍රියාත්මක කර තිබුණි.

## 2.9 මහජනයා වෙත සේවා ඉටු කිරීම

අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම, ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ මහාමාර්ග අංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 264.32 | 263.29 | 1.03 | 0.38 |
| | මූලධන | 131,661.02 | 129,882.89 | 1,778.13 | 1.35 |
| | **එකතුව** | **131,925.34** | **130,146.18** | **1,779.**16 | **1.34** |
| 2014 | පුනරාවර්තන | 427.52 | 361.39 | 66.13 | 15.46 |
| | මූලධන | 142,894.75 | 132,171.56 | 10,723.19 | 7.5 |
| | **එකතුව** | **143,322.27** | **132,532.95** | **10,789.32** | **7.52** |
| 2015 | පුනරාවර්තන | 228.82 | 219.66 | 9.16 | 3.17 |
| | මූලධන | 201,771.70 | 177,173.99 | 24,597.71 | 12.19 |
| | **එකතුව** | **202,000.52** | **177,393.65** | **24,606.87** | **11.88** |
| 2016 | පුනරාවර්තන | 260.52 | 245.04 | 15.48 | 5.94 |
| | මූලධන | 173,125.48 | 145,844.58 | 27,280.90 | 15.75 |
| | **එකතුව** | **173,386.00** | **146,089.62** | **27,296.**38 | **15.74** |
| 2017 | පුනරාවර්තන | 274.73 | 228.71 | 46.02 | 16.75 |
| | මූලධන | 205,975.71 | 191,810.34 | 14,165.37 | 6.87 |
| | **එකතුව** | **206,250.44** | **192,039.05** | **14,21**1.39 | **7.00** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 733.2 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිඳු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 46 ක් සඳහා එකතුව රු. මිලියන 13,437.4 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාවලින් එකතුව රු.මිලියන 7,516.1 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 05 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව සඳහන් කර තිබුණත්, පරිපූරක අයවැය ඇස්තමේන්තු මඟින් රු.මිලියන 21,865 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් කිසිඳු උපයෝජනයක් නොකර එම ප්‍රතිපාදනය ඉතිරි කර තිබුණි.

**(ඇ) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම.**

----------------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ 02 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 302 ක්, රු.මිලියන 205 ක් හා රු.මිලියන 2,473.7 ක් වශයෙන් එකතුව රු. මිලියන 2,980.7 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2,802 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 178.5 ක් හෙවත් සියයට 7.2 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මහාමාර්ග අංශයෙන් යළි පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දුන් ණය මුදලින් රු.මිලියන 351.33 ක ණය ශේෂයක් 2017 දෙසැම්බර් 31 දින වන විට පවතින බව තහවුරු වී තිබුණි. නමුත් එදිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එම ණය ශේෂය රු.මිලියන 91.18 ක් ලෙස දක්වා තිබුණි.

(ii) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් රු.මිලියන 302 ක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි. ඉන් රු.මිලියන 168.2 ක් පමණක් අදාළ කටයුතු සඳහා වැය කර තිබුණි.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---------------------------------------------

ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් එකතුව රු.292,322 ක ණය ශේෂයක් අය විය යුතුව පැවතුණි. වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එමින් පැවති එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

**2.12 පොදු තැන්පත් ගිණුම්**

----------------------------

අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 298.22 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු. මිලියන 30.10 ක්වූ තැන්පතු 310 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** මුදල් රෙගුලාසි 215(3) විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය නොලබා අමාත්‍යාංශය විසින් රු. මිලියන 173.6 ක් වැය ගිණුමට හර කර පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

**2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------------

මහාමාර්ග අංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) තොග පොත | මුදල් රෙගුලාසි 757 හා 763 | පවත්වා නොතිබුණි. |
| (ආ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි891(i) | -එම- |
| (ඇ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි454 (2) | -එම- |
| (ඈ) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | - එම - |
| (ඉ) හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) පරිගණක උපකරණ හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක AIA/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | -එම- |

**2.14 අනුකූල නොවීම්**

**2.14.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| xv පරිච්ඡේදයේ 10.1 (ආ) වගන්තිය | අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් දෙදෙනෙකු විසින් අවස්ථා 03 කදී විදේශ ගතවී තිබුණත්, දිවයිනෙන් බැහැරවීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| **(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| (i) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 02(ii) වගන්තිය | වාහන ලියාපදිංචි වී ඇති අමාත්‍යාංශය අහෝසි වී තිබුණත්, එම කාර්යයන් හා කර්තව්‍යයන් පැවරී ඇති අමාත්‍යාංශයේ නමට වාහන 18 ක් ලියාපදිංචි කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2001 ජූලි 02 දිනැති අංක MF/GA2/ චක්‍රලේඛ/2001/03 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී මහාමාර්ග අංශයේ නිලධාරීන් අවස්ථා 22 කදී පුහුණුවීම් හා සම්මන්ත්‍රණ සඳහා විදේශගත වී තිබුණු අතර, එක් අවස්ථාවකදී නිලධාරියෙකු විසින් ලබා ගත් පුහුණුව පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාව සමාලෝචිත වර්ෂය අවසනා වන විටත්, මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සේවක සබඳතා) වෙත ඉදිරිපත් කර |

නොතිබුණි.

**2.14.2 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්**

2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතට අදාළව 2014 ජූලි 25 දිනැති අංක SEC/2014/05 දරන දේශීය ආදායම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර උපයන විට ගෙවීම් බදු අදාළ සේවාදායකයා විසින් ගෙවිය යුතුව තිබුණි. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන, කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය (කඩවත සිට කෙරවලපිටිය දක්වා), ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය හා දෙවන කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය යන විදේශාධාර ව්‍යාපෘතිවල විදේශීය උපදේශකවරුන් සඳහා උපයන විට ගෙවීම් බදු රු.මිලියන 9.24 ක් එම ව්‍යාපෘති විසින් ගෙවිය යුතු වූ බැඳීම් ලෙස දක්වා තිබුණි. එසේම ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන විසින් සමාලෝචිත වර්ෂයේදී උපයන විට බදු වශයෙන් රු.මිලියන 16 ක් ගෙවා තිබුණි.

**2.15 අභ්‍යන්තර විගණනය**

2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන පැවරුම් 23 ක් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. 2018 ජුනි 31 දින වන විටත් පැවරුම් 12 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද, මහාමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 11 ක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු 2016 හා 2017 වර්ෂවල සිදු කර නොතිබුණි.

**2.16 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

මහාමාර්ග අංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 21 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 280 | 245 | 35 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 38 | 25 | 13 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 04 | 04 | - |
| | **එකතුව** | **353** | **296** | **57** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් අමාත්‍යාංශ කටයුතු සඳහා යොදවා ගැනීම**

සමාලෝචිත වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 34 දෙනෙක් මහාමාර්ග අංශයේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණි.

(ආ) **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

--------------------------------------------------------------------

මහාමාර්ග අංශය විසින් සංවර්ධන නිලධාරීන් 157 දෙනෙකු වර්ෂ 4 ½ ක කාලයක සිට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මුදාහැර තිබුණි.

**2.17 රජයේ නිලධාරීන් ඇප තැබීම**

--------------------------------

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව මහාමාර්ග අංශය හා ඒ යටතේ ඇති ව්‍යාපෘති 39 ක ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.

**2 කොටස - උසස් අධ්‍යාපන අංශය**

--------------------------------------

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

------------------------------------------------

**3.1 කාර්යසාධනය**

------------------

**3.1.1 නේවාසිකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය**

---------------------------------------

නේවාසික ශිෂ්‍යයන් සංඛ්‍යාව 12,000 කින් වැඩි කිරීම සඳහා ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ එක් නේවාසිකාගාරයක් වෙනුවෙන් රු. මිලියන 220 ක සාමාන්‍ය වියදමක් ඇස්තමේන්තු කර 2017 වර්ෂයේදී III අදියර යටතේ නේවාසිකාගාර 24 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතියේ III වන අදියර යටතේ ඉදිකරමින් පවතින නේවාසිකාගාර 24 න් නේවාසිකාගාර 07 ක භෞතික ප්‍රගතිය සියයට සියයක්ව තිබූ අතර, ඉතිරි නේවාසිකාගාර 17 ක සියළුම ඉදිකිරීම් කටයුතු 2018 සැප්තැම්බර් මාසය අවසන් වන විට නිමකළ යුතුව තිබුණි. එසේ වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම නේවාසිකාගාර 24 හි ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 17 ක සිට සියයට 99 ක් දක්වා ප්‍රමාණයක පැවතුණි.

(ආ) නේවාසිකාගාර ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව විශ්වවිද්‍යාල වෙත අදාළ ගොඩනැගිල්ල පවරා දීමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත එම ගොඩනැගිලි පරිහරණය කිරීමෙන් ඉදිකිරීම්වල දෝෂයන් හඳුනාගෙන එම දෝෂයන් කොන්ත්‍රාත්කරුට දැන්වීමෙන් අනතුරුව අදාළ නිවැරදි කිරීම් කරගැනීමට හැකියාව තිබුණි. එසේ වුවද, සියළුම වැඩ අවසන් නේවාසිකාගාර 07 ක් සිසු අයිතියට පැවරීමට වර්ෂ 01 ක සිට වර්ෂ 01 ½ ක් දක්වා කාලයක් ගතවීම හේතුවෙන් දෝෂ හඳුනාගැනීමේ ගිවිසුම්ගත කාලය ඉක්මවා තිබුණි.

(ඇ) නේවාසිකාගාර ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවලට පරිබාහිරව ලී බඩු උපකරණ සපයාදීම, ජල හා විදුලි සම්බන්ධතා ලබාදීම හා අකුණු සන්නායක සවිකිරීම ආදී යටිතල පහසුකම්, ඉදිකිරීම් නිමවීමට සමගාමීව ඉටුකිරීම පිළිබඳ වගකීම අදාළ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට පවරා තිබුණි. නමුත් එම කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ වගකීම උසස් අධ්‍යාපන අංශය වෙත පැවරී තිබුණි. එම කාර්යයන් හා වගකීම් නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් නේවාසිකාගාර සිසු අයිතියට පැවරීමට නොහැකි වී තිබුණි.

**3.1.2 සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුව තිබුණත්, පහත සඳහන් නිරීක්ෂණ අනුව එම විධිවිධානවලට අනුකූල වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(අ) උසස් අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක වූ විදේශ ව්‍යාපෘති 13 ක ඉලක්ක හා අපේක්ෂිත ප්‍රතිඵල එහි සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කලීන කළ උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම, ක්‍රියාත්මක කාල රාමුව හා එහි ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵල ඇස්තමේන්තු කර දක්වා නොතිබුණි.

**3.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රධාන අරමුණු 07 ක් ඉටු කළ යුතුව තිබුණද, ඉන් අරමුණු කිහිපයක් පමණක් ඉටුකර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් අරමුණු යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනය සඳහන් කර නොතිබුණු බැවින් ඉටු නොකළ අරමුණු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය නිශ්චය කර ගැනීමට නොහැකි විය.

**(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ ඉලක්කයන් යටතේ පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය ඉහළ නැංවීම සඳහා අරමුණු 03 ක් යටතේ ඉලක්කය ලබා කර ගැනීමට සැලැසුම් සකස් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

- **උපාධිධාරී රැකියා නියුක්තභාවය ඉහළ නැංවීම සහ ආචාර්ය උපාධි සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය වැඩි කිරීමේ අරමුණ**

  2014 වර්ෂයේදී සියයට 59 ක් ලෙස පැවති උපාධිධාරී රැකියා නියුක්තිභාවය 2017 වර්ෂයේ සියයට 60 දක්වා වැඩි කිරීමට හා 2014 වර්ෂයේදී සියයට 45.1 ක්ව පැවති ආචාර්ය උපාධි සඳහා සුදුසුකම්ලත් විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය 2017 වර්ෂය අවසාන වන විට සියයට 51 දක්වා වැඩි කිරීමටත් සැලැසුම් සකස් කර තිබුණි. එසේ වුවද, ඉලක්කවල කාර්යසාධන මට්ටම පරීක්ෂා කිරීමට අදාළ ක්‍රමවේදයක් උසස් අධ්‍යාපන අංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබුණි.

- **රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව ඉහළ තත්ත්වයකට ගෙන ඒමේ අරමුණ**

  ---------------------------------------------------------------------------

  විශ්වවිද්‍යාලවලට අදාළ ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව අවම වශයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල 03 ක් මුල් 1,000 අතරටද, තවත් විශ්වවිද්‍යාල 03 ක් මුල් 2,000 අතරට හා ඉතිරි ඒවා මුල් 5,000 අතරට තබා ගැනීමට කටයුතු කිරීම අරමුණ වී තිබුණි. එසේ වුවද, 2015 වර්ෂයේ පැවති තත්ත්වයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී ලබා වී ඇති තත්ත්වය සැසඳීමේදී සැලැසුමට ඇතුළත් කර තිබූ විශ්වවිද්‍යාල 06 ක් විශ්වවිද්‍යාල 05 කට ලෝක ශ්‍රේණිගත කිරීමේදී පැවති තත්ත්වයට අඩු තත්ත්වයක් හිමි වී තිබුණි. එය සියයට 10 ක සිට සියයට 20 ක් දක්වා පරාසයක පැවතුණි.

- **රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල තුළ විදේශ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ අරමුණු**

  ---------------------------------------------------------------------------

  දේශීය විශ්වවිද්‍යාල ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් තුළ ඉහළ තත්ත්වයකට පත්කිරීමේ අරමුණින්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල තුළ විදේශ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය වැඩි වී තිබුණි. එසේ වුවද, 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 07 ක කාල පරාසය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ දී ශිෂ්‍ය සංඛ්‍යාව 05 ක් වූ 2013 වර්ෂය වන විට එය 44 ක් දක්වා වර්ධනය වී තිබුණත්, ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් අඩු වී 2016 වර්ෂයේ හා 2017 වර්ෂයේදී ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 07 ක් හා 13 ක් දක්වා අඩු වී තිබුණි.

**(ii) අතිරේක ශිෂ්‍යයන් 900 ක් තාක්ෂණ විෂය ධාරාවට ඇතුළත් කර ගැනීම**

---------------------------------------------------------------------------

අයවැය යෝජනා අනුව තාක්ෂණික විෂය ධාරාවට ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 2017 වර්ෂයේදී 900 කින් වැඩි කිරීම ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලෙස සලකා විශ්වවිද්‍යාල 11 ක් සඳහා 2016 සහ 2017 වර්ෂ 02 ක සඳහා පිළිවෙළින් රු.මිලියන 1,500 ක් හා රු. මිලියන 700 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ තාක්ෂණ විෂය ධාරාවට බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 260 කින් අඩු වී තිබුණි.

**(iii) නිල නිවාස 50 ක් ඉදිකිරීම**

----------------------------------

2016 අයවැය යෝජනාවක් අනුව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය වෙනුවෙන් නිල නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 2016 හා 2017 වර්ෂවල නිල නිවාස 51 ක් ඉදිකිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා රු. මිලියන 300 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන විශ්වවිද්‍යාල 09 ක් සඳහා නිල නිවාස 50 ක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සඳහා එක් නිල නිවාසයක් ලබාදීමට සැලැසුම් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිල නිවාස 51 කින් නිල නිවාස 22 ක භෞතික ප්‍රගතිය සියයට 60 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

**(iv) ආචාර්ය උපාධි 150 ක් සහ පශ්චාත් උපාධි 50 ක් පිරිනැමීම**

---------------------------------------------------------------

2017 අයවැය යෝජනාවක් අනුව මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යයනය කාර්ය මණ්ඩලය සඳහා ආචාර්ය උපාධි (PHD) 150 ක් සහ නව පශ්චාත් උපාධි 50 ක් පිරිනැමීම ඉලක්ක කරගෙන 2017 වර්ෂයේදී රු.මිලියන 34.37 ක් වැයකර තිබුණි. නමුත්, ආචාර්ය උපාධි 74 ක් හා පශ්චාත් උපාධි 19 ක් වැනි අඩු ප්‍රමාණයක් උපාධි පිරිනමා තිබුණි.

**3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව උසස් අධ්‍යාපන අංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී උසස් අධ්‍යාපන අංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 06 ක් සඳහා එකතුව රු.මිලියන 5,259.6 ක ශුද්ධ ප්‍රතිපාදනයක් හා විදේශ ආධාර ව්‍යාපෘති 13 ක් සඳහා රු.මිලියන 1,837.5 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට, ඉන් පිළිවෙලින් රු.මිලියන 4,047.5 ක් හා රු.මිලියන 754.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,285 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

**3.2.1 විදේශ ආධාර ව්‍යාපෘති**

**විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 13 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,082.90 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 58.9 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට නොහැකිවීම කෙරෙහි ඒ පිළිබඳව සිදු කළ යුතු පසු විපරම් කටයුතුවල පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) යාපනයේ විශ්වවිද්‍යාලයේ පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතිය හා පිරිසිදු බලශක්ති තාක්ෂණයක් සඳහා නීති ද්‍රව්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන හා පර්යේෂණ සහයෝගීත්වය යන ව්‍යාපෘති 02 ක භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියයට 05 ක පමණ අඩු මට්ටමක පැවතුණි.

(ආ) නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ මනා සෞඛ්‍යය හා පෝෂණය තුළින් නව යොවුන් වියේ දරුවන්ගේ හෘද පරිවෘත්තිය අවධානම අවම කිරීම යන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 10 ක් හා සියයට 25 ක අඩු මට්ටමක පැවතුණි.

(ඇ) වසෝ ඒෂියා ව්‍යාපෘතිය වෙනුවෙන් 2015, 2016 සහ 2017 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 20.6, රු.මිලියන 25.0 ක් හා රු.මිලියන 30.0 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 65 ක් පමණ වී තිබුණි ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සියයට 13 ක් වැනි අවම අගයකින් ව්‍යාපෘතිය වර්ධනය වී තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

උසස් අධ්‍යාපන අංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

**-----------------------**

උසස් අධ්‍යාපන අංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 26 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 349,095.8ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.7,267,642ක්ද, වාහන සේවා කිරීම සඳහා රු.1,241,420 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.3,050,920 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.2,422,540 ක්ද වශයෙන් එකතුව රු.13,982,522 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 40 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ඉන්ධන දහනයවීම් පරික්ෂා නොකිරීම**

**---------------------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය අදාළව වාහන 24 ක ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

**(ii) වාහන අළුත්වැඩියා කිරීම්**

**----------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු කර වාහන අළුත්වැඩියා කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතු වුවත්, උසස් අධ්‍යාපන අංශයට අයත් වාහන 03 ක අළුත්වැඩියා කිරීමේ කටයුතු නිම කිරීමට වර්ෂ 01 ක සිට වර්ෂ 1 ½ ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රු.මිලියන 284.52 ක් වටිනා වාහන 24 ක් සමීක්ෂණය කර එම වාර්තාව මාස 04 පමණ ප්‍රමාදයකින් පසුව 2018 ජූලි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) 2017 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අයිතම 66 ක අතිරික්තතාවයන් හා අයිතම 360 ක ඌනතාවයන් සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 බැඳීම් හා බැරකම්**

**-------------------**

2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය විසින් බේරුම් නොකළ වැය විෂයයන් 17 කට අදාළ බැරකම්වල වටිනාකම රු.මිලියන 308.85 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 94(1) හි සඳහන් විධිවිධානවලට පටහැනිව එම වැය විෂයයන් 17 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.මිලියන 4.8 කින් ඉක්මවා එම බැරකම්වලට එළඹ තිබුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

**විදේශ ගමන් වියදම්**

**----------------------**

2017 පෙබරවාරි මාසයේදී සිංගප්පූරුවේ සහ 2016 ජුනි මාසයේදී පිලිපීනයේ හා මැලේසියාවේ සිදු කළ විදේශ සංචාරවලට අදාළ පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) උසස් අධ්‍යාපන අංශයේ වූ විශ්වවිද්‍යාලවල ඉදිකිරීම් කාර්යයන්, විශ්වවිද්‍යාල මට්ටමින් අධීක්ෂණයට කරනු ලබන වැඩ ඉංජිනේරුවරුන්ට මහාපරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති සහ ඒවායේ නඩත්තු කිරීම පිළිබඳව අවබෝධයක් ලබාදීමේ අරමුණින් සිංගප්පූරුවේ විදේශ සංචාරයකට සහභාගී කර තිබුණි. එම සංචාරය සඳහා ව්‍යාපෘති කාර්යාලයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවා ඔවුන් වෙනුවෙන් සංයුක්ත දීමනාව සහ අනියම් දීමනා වශයෙන් රු.230,000 (එ.ජ.ඩොලර් 1496) ක් ගෙවා තිබුණි. එම වියදම සංචාරයේ අරමුණුවලට අනුකූල වී නොතිබුණි.

(ආ) රජයේ ස්ථිර තනතුරක් නොදරන උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ඉහත විදේශ සංචාර දෙකටම සහභාගී වී තිබුණි. එම සංචාරවලට අදාළ අනියම් හා සංයුක්ත දීමනා ලෙස පිළිවෙළින් රු.115,400 (එ.ජ.ඩොලර් 748) ක් හා රු.30,856 (එ.ජ.ඩොලර් 280) උසස් අධ්‍යාපන අංශය විසින් ගෙවා තිබුණි.

(ඇ) සංචාර නිමකර දිවයිනට පැමිණීමෙන් අනතුරුව සංචාරය තුළින් ලද අත්දැකීම් හා ලද පුහුණුව පිළිබඳ වාර්තාවක් ලබාදිය යුතු වුවද, සංචාර දෙකටම සහභාගී වූ නිලධාරීන් 34 දෙනෙකු විසින් අදාළ වාර්තා ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**3.6 අනාර්ථික ගනුදෙනු**

**---------------------**

යෝජිත ගුරු පුහුණු ඒකකය ස්ථාපිත කිරීමටත්, කොළඹ උසස් අධ්‍යාපන අංශ ගොඩනැගිල්ලෙහි පවත්වා ගෙන යනු ලබන සැලසුම් අංශය ස්ථාපිත කිරීමට හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පවත්වාගෙන යාම සඳහා බත්තරමුල්ල වික්‍රමසිංහ මාවතේ පිහිටි ගොඩනැගිල්ලක මහල් 03 ක් රු.570,000 ක මාසික කුලී පදනම මත ලබා ගෙන තිබුණි. 2017 ජූලි මාසයේදී බදුකරු සමඟ වර්ෂ 03ක බදු ගිවිසුමකට එළඹ කුලී තැන්පතු වශයෙන් රු.1,710,000 ක් ගොඩනැගිලි හිමිකරු වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වර්ග අඩි 4,500 ක සිට 5,000 ක් අතර ප්‍රමාණයක ගොඩනැගිලි අවශ්‍යතා පැවතියද එම අවශ්‍යතාවය නොසලකා හැර වර්ග අඩි 6,000 ක ප්‍රමාණයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.

**(ii)** තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුව කුලියට ගනු ලබන ගොඩනැගිල්ල දැනට උසස් අධ්‍යාපන අංශය පවත්වාගෙන යනු ලබන කොළඹ 07, වෝඩ් පෙදෙස හෝ බත්තරමුල්ල සීමාව තුළ පිහිටිය යුතුව තිබුණි. එසේ වුවද, වෝඩ් පෙදෙස ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් අවධානය යොමු නොකර නිර්දේශ සලකා බැලීමකින් තොරව බත්තරමුල්ල ප්‍රදේශයේ ගොඩනැගිල්ලේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ස්ථාපිත කිරීම හේතුවෙන් කාර්යාල කටයුතු කරගෙන යාමේදී අමතර පිරිවැයක් මෙන්ම අමතර කාලයක් වැයවන තත්ත්වයක් උද්ගත වී තිබුණි.

**(iii)** කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ වර්ග අඩි 2,000 ක් යෝජිත ගුරු පුහුණු ඒකකය ස්ථාපිත නොකිරීම හා එම වැඩසටහන සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා 2017 අප්‍රේල් මාසයේදී රු.1,150,000 ක් වැය කර පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. සැලසුම් කළ පරිදි එම වැඩසටහන

ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රචාරණ ගාස්තුව සහ ගොඩනැගිලි කුලිය එකතුව රු.2,280,000 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**(iv)** මෙම ගොඩනැගිල්ල කුලියට ගැනීමට පෙර කුලී පදනම මත කාර්යාල පවත්වා තිබූ පරිසර අමාත්‍යාංශයට 2016 මාර්තු මාසයේ සිට ඉදිරි වසර දෙකක කාලයකට බල පැවැත්වෙන පරිදි වර්ග අඩියක රු.50 ක කුලී රේටයක් ඇතුළත් තක්සේරු වාර්තාවක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි. එසේ වුවද, 2016 ජූනි මස එම අමාත්‍යාංශය ඉවත්ව ගිය පසු නැවත ගොඩනැගිල්ලේ යම් යම් නවීකරණයන් හේතුවෙන් වර්ග අඩියක මිල යම් ප්‍රමාණයකින් ඉහළ යා හැකිව තිබුණද, මාස 02 ක් වැනි කෙටි කාලයක් තුළ වර්ග අඩියක් රු.95 ක් වැනි ඉහළ කුලියක් තීරණය වී තිබීම මතභේදයට තුඩුදෙන කරුණක් වී තිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන උසස් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි කිරීමේදී අය කරනු ලබන තැන්පත් මුදල් එම උසස් අධ්‍යාපන ආයතනවල නියාමන කටයුතු සඳහා උපයෝජනය කළ යුතුව තිබුණි. එසේ අයකරගෙන තිබුණු තැන්පත් මුදල් එම උසස් අධ්‍යාපන ආයතනවල කිසිදු නියාමන කටයුත්තකට උපයෝජනය කර නොතිබුණි. 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 22 කින් අවස්ථා 38 කදී රු.මිලියන 109 ක් ලැබී තිබුණු අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ උසස් අධ්‍යාපන අංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | ඉතිරිය<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 877 | 839 | 38 | 4.38 |
| | මූලධන | 3,901 | 2,786 | 1,115 | 28.58 |
| | **එකතුව** | **4,778** | **3,625** | **1,153** | **24.13** |
| 2014 | පුනරාවර්තන | 1,090 | 1,090 | - | - |
| | මූලධන | 7,088 | 7,019 | 69 | 0.97 |
| | **එකතුව** | **8,178** | **8,109** | **69** | **0.84** |
| 2015 | පුනරාවර්තන | 1,306 | 1,222 | 84 | 6.43 |
| | මූලධන | 9,343 | 8,364 | 979 | 10.48 |
| | **එකතුව** | **1,0649** | **9,586** | **1,063** | **9.98** |
| 2016 | පුනරාවර්තන | 1,386 | 1,302 | 84 | 6.06 |
| | මූලධන | 7,466 | 5,113 | 2,353 | 31.52 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **8,852** | **6,415** | **2,437** | **27.53** |
| 2017 | පුනරාවර්තන | 1,740 | 1,372 | 368 | 21.15 |
| | මූලධන | 8,099 | 5,697 | 2,401 | 29.66 |
| | **එකතුව** | **9,839** | **7,069** | **2,770** | **28.15** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**---------------------------------------------------**

වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 323.9 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**----------------------------**

වැය විෂයයන් 19 ක් සඳහා එකතුව රු.මිලියන 1,682.9 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 621 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

**---------------------------------------------------------------------**

පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් වැය විෂයයන් 12 ක් සඳහා එකතුව රු.මිලියන 1,318 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**--------------------------------------------**

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**----------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.350,977 ක් වී තිබුණි. එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත් එම ණය ශේෂ අයකර ගැනීමට උසස් අධ්‍යාපන අංශය අපොහොසත් වී තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**-------------------------------------------------------------------------------------**

උසස් අධ්‍යාපන අංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් උසස් අධ්‍යාපන අංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 73.9 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.648,413 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ---------------- | ---------------- | -------------- | ----------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 19 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 132 | 69 | 63 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 45 | 23 | 22 |
| | | ----- | ----- | ----- |
| | එකතුව | 210 | 114 | 96 |
| | | === | === | === |